**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 2019**

**-----------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිඝ.පාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත වියදම් අයිතම 05 ක වටිනාකම වූ රු. 2,519,794 ක් සහ රු.406,790 ක් වූ ලැබිය යුතු ආදායම් අයිතම 03 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | අදාළ වටිනාකම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ගැලපුම් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | ප්‍රමිත 02 නියමයන්ට අනුකූලව රු. 32,383,494 ක පොලී ආදායම හා රු. 25,802 ක මූල්‍ය වියදම | කෙටිකාලීන තැන්පත්වලින් ලද මුළු පොලී ආදායම ආයෝජන ක්‍රියාකාරකම්වල | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර, කෙරීගෙන යන වැඩ සඳහා ගෙවන ලද රු. 1,644,344 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු. 1,150,386 ක පාරිතෝෂික ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | දැක්වෙන කෙටිකාලීන තැන්පත් වැඩිවීම් යටතේ දක්වා ඇති රු.12,121,012 වටිනාකම තුල අන්තර්ගතව ඇත.<br>තව දුරටත් කාර්ය නිමවී නැති බැවින් කෙරීගෙන යන වැඩ වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්වීම නිවැරදි වේ.<br>පාරිතෝෂික ගෙවීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ඉදිරියේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බවද දන්වමි. | |
| (ඇ) | ප්‍රමිත 07 හි 65 වගන්තිය අනුව අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය නොකිරීම නිසා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. මිලියන 196 ක වත්කම් ඉහත වත්කම් පිරිවැය තුල අන්තර්ගත වී තිබුණි. එසේ වුවත් එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ සටහන් අංක 09 දේපල, පිරියත සහ උපකරණ ලැයිස්තුවේ 2018.12.31 පිරිවැය ශේෂයට වත්කම්වල වෙනස්වූ වටිනාකම ගලපා එයට අදාල ක්ෂය ගැලපීම්ද නිවැරදිව සිදු කර ඇත. අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය වෙන් කිරීම් උපලේඛනවල ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කල භාෂා අංශයේ හා පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ ලැබිය යුතු රු. 12,195,650 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබීම හේතුවෙන් වත්කම්වල අගය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම කපාහැර ඇති ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර අනුමතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | උපලබ්ධි නොවන ශේෂ නිශ්චිත අනුමැතිය මත පමණක් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වෙනත් පරිභෝජනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකමින් රු. 216,197 ක බැර ශේෂයක් අඩුකර දක්වා තිබීම හේතුවෙන් සැපයීම් ද්‍රව්‍ය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර, පෞද්ගලික ආයතන දෙකකට ගෙවිය යුතු රු. 545,645 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අත ඉතිරි තොග ශේෂය දැක්වෙන අනෙකුත් තොග ශේෂ ගැලපීමේදී පාරිභෝජනය කරන ලද ද්‍රව්‍ය පිරිවැය සෘණ අගයක් ලෙස ගණනය වී ඇත. එය පරීක්‍ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. ආපනශාලා හිමිකරුට සහ සංඥා සම්ප්‍රේෂණ කුළුණකට අදාලව ගෙවිය යුතු ලෙස සටහන් කර තිබුණු පිළිවෙලින් රු.150,000 හා රු 397,645 ක වටිනාකම ඉදිරියේදී ලැබිය යුතු ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් නිවැරදිව පිළියෙල කල යුතු බව |
| (ඇ) | ස්ථාවර වත්කම්වල ක්ෂය ගණනය කිරීමේදී ස්ථාවර වත්කම් අයිතමයන් 03ක පිරිවැය රු. 2,311,550 ක් වැඩියෙන්ද, ස්ථාවර වත්කම් අයිතමයන් 05 ක පිරිවැය රු.14,852,647 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ආයතනයේ මෝටර් රථවල ක්ෂය වෙන් කිරීම් රු. මිලියන 8.6 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වෙනස්කම් 2020 ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ස්ථාවර වත්කම් පිරිවැය මෙන්ම ක්ෂය වෙන්කිරීම ගණනය කිරීම නිවැරදිව සිදුකළ යුතුබව. |
| (ඈ) | උපචිත වියදම් ගිණුමේ පසුගිය වර්ෂ කිහිපයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකළ රු. 1,994,507 ක ශේෂයට අදාලව තව දුරටත් වගකීමක් නොමැති නම් ආදායමට ලියා හැරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයකට වැඩි කාලයක් උපචිත වියදම් ලෙස පෙන්වනු ලබන රු.1,994,507 ක මුදල සම්බන්ධ වියදම් පරීක්‍ෂා කර බලා 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශයන්හි වර්ෂ 5 ඉක්මවූ ලැබිය යුතු ශේෂ වටිනාකම රු.7,922,875 ක් විය. | පශ්චාත් උපාධි අංශය වෙත අදාළ පාඨමාලාවට ලියාපදිංචි ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ඉතිරි මුළු පාඨමාලා ගාස්තුවම වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස පෙන්වා ඇත. ලියාපදිංචි වුවද මෙම පාඨමාලා හැදෑරීම සඳහා සහභාගී වීම සිදු වී නොමැති බැවින් ලැබිය යුතු වටිනාකම් ගිණුම් වලින් ගලපා ඉවත් කර ඇත | පැරණි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශයන්හි වර්ෂ 1ත් 5ත් අතර ගෙවිය යුතු ශේෂ වටිනාකම රු.12,812,322 ක් වූ අතර වර්ෂ 5 ක් ඉක්මවූ ශේෂය රු.17,180,549 ක් විය | මෙම ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා ඇති මුදල් උපදේශන සේවා විභාග, සේවාරම්භක පුහුණු වැඩසටහන් සහ විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා රජයේ ආයතන මඟින් ලැබුණු මුදල් වේ. එම වැඩසටහන් අතර දැනටමත් කෙරීගෙන යන, අවසන් සහ තවදුරටත් ආරම්භ නොවූ වැඩසටහන් සඳහා ගෙවිය යුතු ශේෂ ලෙස පෙන්නුම් කළ මුදලද මෙහි දැක්වේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

## 1.7 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීමේ පනතේ දක්වා ඇති අරමුණක් නොවන සහ ආයතනයේ පුහුණු වැඩ සටහන්වලට අදාළ නොවන කාර්යක්ෂමතා කඩඉම් විභාග 37ක් ප්‍රවර්තන වර්ෂය තුලදී | විභාග මගින් ඇගයීමේ ක්‍රමවේදය අමාත්‍ය මණ්ඩලය විසින් විභාග දෙපාර්තමේන්තුවට පවරා දුන්න ද එය අසාර්ථක වීම මත රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ අංක අමප/18/2011/828/043 හා 2019.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2019.05.21 දිනැති අමාත්‍ය | පනතේ අරමුණු අනුව කටයුතු කළ යුතු බව. |

| | |
|---|---|
| පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. | මණ්ඩල තීරණයට අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට දීප ව්‍යාප්ත සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ දෙවන භාෂා පරීක්ෂණ පැවැත්වීම සඳහා නැවත අධිකාරී බලය ලබා දෙන ලදී. |

## 1.8 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2010 ජුලි මස 09 දිනැති අංක CA/1/1/16/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ ලිපිය | විදේශගත වන රාජ්‍ය නිලධාරීන් දිවයිනට පැමිණීමෙන් පසු චක්‍රලේඛ ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී විදේශගත වූ ආයතනයේ නිලධාරීන් 07 දෙනෙකු විසින් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විදේශ ගතවූ සියලු නිලධාරීන් අදාල වාර්තා බාර දීඇති අතර එම වාර්තා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ලිපිගොනුවල අන්තර්ගත නොවූ බැවින් ඒවා ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 44 කදී ලබාගත් රු. 2,498,440 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට දින 19 ක සිට දින 119 ක් අතර කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | ඉදිරියේදී අත්තිකාරම් ලබා ගතහොත් අදාළ කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කරන මෙන් නැවතත් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ ආරම්භක ලැබිය යුතු ශේෂ රු. 330,000 ක් හා පෙර වර්ෂවලදී භාෂා අංශයේ ලැබිය යුතු ලෙස අධි තක්සේරු කරන ලද රු. 478,011 ක් පාලක සභා අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | මෙම කපාහැර ඇති ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර අනුමතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඈ)** | 2016 මාර්තු 31 දිනැති අංක 2014/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත කාල රාමුව තුළ විගණකාධිපති වෙත හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය එය පිළියෙල කර තිබුණේ 2020 අගෝස්තු 24 දිනය. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් වනුයේ 2019.12.31 දිනට ආයතනයේ පැවති වත්කම් සහ භාණ්ඩ වල ප්‍රමාණාත්මක අගයකි. ආයතනය තුළ අඛණ්ඩව පවත්වාගෙන ආ ලෙජර් ගිණුම් අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් නිවැරදි බව දන්වමි. පැවැතිය යුතු අනුරූපීතාව කෙරෙහි ඉදිරියේදී අවධානය යොමු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ඉ)** | 2003 ඔක්තෝබර් 28 දිනැති අංක PED/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිලධාරීන් විදේශ ගත වීමට ප්‍රථම රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක ජනරාල්ගෙන් අනුමැතිය ලබා ගත යුතු නමුත් නියැදි පරීක්ෂාව අනුව අවස්ථා 07 ක දි නිලධාරීන් 07 ක ගේ විදේශ ගමන් සඳහා අදාළ අනුමතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේ පැවැත්වෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් විදේශගත වන අවස්ථාවන්හිදී PED/17 චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ඊ)** | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.31,228,496 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන අනුව ලේඛනයක් පවත්වා ගැනීම හෝ සකස්කර ඇති ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතුකර නොතිබුණි. | විගණන අවස්ථාවේ ස්ථාවර වත්කම් ලේඛනවල පැවති යාවත්කාලීනවීමේ අඩුපාඩු සකස් කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ල) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය | දිරිදීමනා පටිපාටිය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු නමුත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී රු.6,041,471 ක්ද 2018 වර්ෂයේදී 7,469,067 ක් හා 2019 වර්ෂයේ දී රු. 2,380,148ක් වශයෙන් ආයතනයේ කාර්ය මණ්ඩලයේ 95 දෙනෙකු වෙත දිරි දීමනා ගෙවා තිබුණි. | ආයතනය පිහිටුවූ පනතේ 31 වගන්තිය යටතේ මෙම ආයතනය සඳහා දිරි දීමනා ගෙවීමට මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ ආයතනය වෙනුවෙන් සිදු කරන උපදේශන කටයුතු වලින් සහ විභාග කටයුතුවලින් ලැබෙන මුදලින් ආයතනයේ නිලධාරින් සඳහා සංචිතගත කරනු ලබන 10% ක ප්‍රතිශතක මුදලින් දිරි දීමනාවක් ආයතනික කාර්ය මණ්ඩලය අතර බෙදා හරිනු ලැබේ. | දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු බව. |

**1.9. මුදල් කළමනාකරණය**

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ පවත්වා ගෙන යන බැංකු ගිණුම් දෙක විශ්ලේෂණය කිරීමේදී වර්ෂය පුරාම මාසිකව සාමාන්‍යයක් වශයෙන් රු.මිලියන විසි පහකට ආසන්න ශේෂයක් පවත්වා ගන්නා බව හා වර්ෂය අවසානයේ රු.22,918,072ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ජංගම ගිණුම්වල විශාල මුදල් ප්‍රමාණයක් රඳවා තබා ගන්නවාට වඩා ඉල්ලූ විට ගෙවන තැන්පතුවල (Call Deposits) මුදල් ආයෝජනය කිරීමෙන් ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථා පිළිබඳව සලකා බලා නොතිබුණි. | ආයතනයේ බැංකු ගිණුම්වල පවත්නා මුදල් ශේෂ එදිනෙදා සහ මාසිකව නිරවුල් කළ යුතු බැඳීම් වලට අදාළ මුදල් බැවින් මෙලෙස බැංකු ගිණුම් දෙකහි මුදල් ශේෂ පවත්වාගෙන යාමද සිදු වේ. | මුදල් පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් විචක්ෂණශීලීව කටයුතු කළ යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,817,697 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 16,428,481 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 36,246,178 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉපයූ ආදායම රු.9,575,449 කින් අඩු වුවද, රජයේ ප්‍රදාන වැඩිවීම හා ගමන් වියදම් හා වෙනත් දීමනා හා විදේශ පුහුණු වියදම් අඩු වීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

කුලී ආදායම හා භාෂා වැඩසටහන් ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 240ක් හා සියයට 836කින් කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනික 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතීයන අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත සියයට 50 ක ද්විතීයන දීමනාවක් ගෙවා තිබුණි. එය ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග අනුව මාසිකව ඉටුකල යුතු අවම පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ලඟාවිය යුතු බව දක්වා තිබුණි. එම නියෝගයට පටහැනිව ආයතනය වෙත 2015 ජූලි සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අය කරගත යුතු රු. 9,152,375ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | එසේ සති අන්තයේ සේවය කිරීම් වෙනුවෙන් ගෙවන දේශන ගාස්තු වලින් අය කිරීම් සිදු කළහොත් කිසිදු නිලධරයකු සති අන්තයේ පැවැත්වෙන පුහුණු පාඨමාලාවක සම්පත්දායකයකු ලෙස යෙදවා ගැනීමට නොහැකි වන අතර සම්පූර්ණයෙන්ම බාහිර සම්පත්දායකයන් මත යැපීමට සිදු වනු ඇත. එසේ වුවහොත් එය සෘජුවම පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මක තත්ත්වය පහල වැටීමට හේතු වන බැවින් අය කිරීම් වැඩකරන දින පහ තුළට සීමා කිරීම් කර ඇත. | පොදු ව්‍යාපාර කාරක සභා නියෝගයට පටහැනිව කටයුතු කර තිබුණු බැවින් නියෝග ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ආ) | 2018 වර්ෂයේ දී “සංධරණි” පර්යේෂණ මධ්‍යස්ථානය රු.3,443,672 ක් වැයකර නවීකරණය කර තිබුණු අතර, පර්යේෂණ මධ්‍යස්ථානයේ ගෘහ භාණ්ඩ, පරිගණක හා අනෙකුත් විද්‍යුත් උපකරණ උපයෝජනය නොකර නිශ්ක්‍රියව පවතින බව භෞතිකව පරීක්ෂා කිරීමේදි නිරීක්ෂණය විය. | පර්යේෂණ අංශයේ සම්පත් උපයෝජනයක් නොකර නිශ්ක්‍රියව පවතින බවට වූ නිරීක්ෂණය නිවැරදි නොවන අතර ආයතනයේ සෙසු අංශ හා සැසඳීමේදී උපයෝජනයේ ඌන භාවයක් පවතින බැවින් උපයෝජන වැඩි කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | වත්කම් නිසි පරිදි උපයෝජනය වන බවට වග බලා ගත යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ප්‍රගති වාර්තාව සැසඳීමේදී 2019 වර්ෂයේ තුල සම්පූර්ණ නොකළ කාර්යයන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i. ඇස්තමේන්තුගත වියදම රු.1,896,800 කින් නිලධාරීන් 840 සඳහා කාලීන පුහුණු වැඩසටහන් 26ක් හා TOT වැඩසටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් පවත්වා තිබුණේ නිලධාරීන් 42 සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් 02 ක් පමණි. | ආයතනය විසින් පැවැත්වීමට සැලසුම් කල මෙම පුහුනු වැඩසටහන් වෙනුවෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම නිසා එම පාඨමාලා ආරම්භ කළ නොහැකි විය | සැලසුම් අනුව කටයුතු කළ යුතු බව. |
| ii. රු. 1,291,125 ක ඇස්තමේන්තුගත වියදමකින් නිලධාරීන් 150 ක් සඳහා සහතිකපත්‍ර වැඩසටහන් 05 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | ආයතනය විසින් පැවැත්වීමට සැලසුම් කල මෙම පුහුනු වැඩසටහන් වෙනුවෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම නිසා එම පාඨමාලා ආරම්භ කළ නොහැකි විය. | සැලසුම් අනුව කටයුතු කළ යුතු බව. |
| iii. රු. 400,000 ක ඇස්තමේන්තුගත වියදමකට නිලධාරීන් 400 දෙනෙකු සඳහා පැය 03 පොදු සම්මන්ත්‍රණ 04 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් කිසිදු සම්මන්ත්‍රණයක් හෝ පවත්වා තිබුණේ නැත. | 2019 වසර තුළ සම්මන්ත්‍රණ 02ක් පවත්වා ඇත. | විගණිත අවස්ථාවේ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර සැලසුම් අනුව කටයුතු කළ යුතු බව. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය 165 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 110 ක් විය. ඒ අනුව තනතුරු 55 | ආයතනයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පාලක සභාවේ අනුමැතියට යටත්ව පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවන ලද අතර පාස්කු ප්‍රහාරය, ජනාධිපතිවරණය හා රට තුල පැවැති කොවිඩ් 19 වසංගතය හා පාර්ලිමේන්තු මැතිවරණය හේතුවෙන් මෙම ක්‍රියාවලිය මේ දක්වා ප්‍රමාදවීම සිදු විය. | ජ්‍යෙෂ්ඨ හා තෘතිය මට්ටමේ තනතුරුවල සියයට 50කට වඩා පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. |

| | |
|---|---|
| ක්ම පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | ඒ අනුව, 2020 වසර සඳහා නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්වේ අනුමැතිය හා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ආයතනයේ දැනට පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ කටයුතු මේවන විට සම්පාදනය කරමින් පවතී. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු නමුත් 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණිත දිනය දක්වා සභාගත කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම තත්‍ය වියදම හා සැසඳීමේදී වියදම් විෂයයන් 4ක් සියයට 11 ක සිට සියයට 200 ක් දක්වා පරාසයක විචලනයක් වූ අතර, ආදායම් විෂයයන් 4ක ආදායමේ විචලනය සියයට 6 ක සිට සියයට 70 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2019 වර්ෂයේ ආදායම් ශීර්ෂ කිහිපයක අඩුවීමක් හා ආදායම් ශීර්ෂ කිහිපයක අපේක්ෂිත ආදායම වැඩිවීමක් පෙන්නුම් කළ බැවින් 2019 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කළ අතර සමස්තයක් ලෙස ගත් විට ආදායම් ඇස්තමේන්තුවේ විශාල වෙනස් වීමක් නිරූපණය නොවේ.<br>අපේක්ෂිත බඳවා ගැනීම් සිදු නොවීම, අපේක්ෂිත පරිදි විදේශීය ගමන් නොයෑදීම හේතුවෙන් එම වැය විෂයන්හි ඇස්තමේන්තු සංශෝධනය කල අතර වියදම් මනා ලෙස කළමණාකරණය කිරීම හේතුවෙන් සෙසු වැය විෂයයන්හි අපේක්ෂිත වියදම් සංශෝධනය කරන ලදී. | වර්ෂය ආරම්භයේ පිළියෙල කළ අයවැය ලේඛනයේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු බව. |